# වාණිජමය ලිංගික කටයුතු පිළිබඳ නීති සහ HIV/AIDS වැළැක්වීම




National STD/AIDS Control Programme

UNFPA

fpa SRI LANKA
enriching relationships

# වාණිජමය ලිංගික කටයුතු පිළිබඳ නීති සහ HIV/AIDS වැළැක්වීම

දෙවන සංස්කරණය (2022)

## සැකසුම

**නිතිවේදී නීතිඥ අජිත් රෝහණ** (LLB, LLM, Atorny At Law)
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති

**නිතිවේදී නීතිඥ දර්ශන ගාල්ලගේ**
ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී (LLB, Atorny At Law)

**නීතිඥ පාලිත හලංගොඩ** (Atorny At Law)
පොලිස් පරීක්ෂක

**නීතිඥ ප්‍රභාත් කරුණාරත්න** (Atorny At Law)

පොලිස් පරීක්ෂක

**වෛද්‍ය ජානකී විදානපතිරණ** (MBBS, MD)
ප්‍රජා වෛද්‍ය විශේෂඥ
අධ්‍යක්ෂ ප්‍රතිපත්ති විශ්ලේෂණ සහ සංවර්ධන

**වෛද්‍ය ජානක වේරගොඩ** (MBBS, MD)
ප්‍රජා වෛද්‍ය විශේෂඥ
ජාතික ලිංගාශ්‍රිත රෝග/ඒඩ්ස් මර්දන වැඩසටහන

## විශේෂ ස්තුතිය

**වෛද්‍ය රසාංජලී හෙට්ටිආරච්චි**
අධ්‍යක්ෂ
ජාතික ලිංගාශ්‍රිත රෝග/ඒඩ්ස් මර්දන වැඩසටහන

**වෛද්‍ය නිමල් එදිරිසිංහ**
විශ්‍රාමික අධ්‍යක්ෂ
ජාතික ලිංගාශ්‍රිත රෝග/ඒඩ්ස් මර්දන වැඩසටහන

**තුෂාරා රණසිංහ**
විධායක අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමය

## සම්බන්ධීකරණය

**නදීකා ප්‍රනාන්දුපුල්ලේ**
ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමය

**නිහාල් නානායක්කාර**
ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමය

**උපේක්ෂ ජයරත්න**
ජාතික ලිංගාශ්‍රිත රෝග/ඒඩ්ස් මර්දන වැඩසටහන

# හැඳින්වීම

අනාරක්ෂිත ලිංගික ක්‍රියා ආශ්‍රිතව ව්‍යාප්ත වන HIV/AIDS යනු උපදංශය, සිෆිලිස් හා හර්පීස් වැනි ලිංගිකව සම්ප්‍රේෂනය වන රෝගයකි. මෙම රෝග එක් අයෙකුගෙන් තවත් අයෙකුට පැතිරෙන්නේ බොහෝවිට අනාරක්ෂිත ලිංගික ක්‍රියා හේතුවෙන් වන අතර වාණිජමය වශයෙන් මුදලට ලිංගික ක්‍රියාවල නිරත වන බොහෝ දෙනෙක් සදාචාරයට සම්බන්ධ නීති ක්‍රියාත්මක කිරීම, ඔවුන්ට සිදු කරන අසාධාරණයක් ලෙස සලකනු ලබයි.

ලංකාවේ නීතියට අනුව යම් කිසි අයෙක් පුද්ගලික මට්ටමෙන් අන්‍යෝන්‍ය කැමැත්ත මත ලිංගික කටයුතු වල යෙදීම වරදක් ලෙස නොසැලකේ. එමෙන්ම අනාචාරයද අපරාධ නීතිය අනුව වරදක් නොවේ. අනාචාරය යනු තම කලත්‍රයා හැර වෙනත් අයෙකු සමඟ ලිංගික සබඳතා පැවැත්වීමයි. කෙසේ වෙතත් අනාචාරය වෛවාහක වරදක් ලෙස දික්කසාද නඩුවකදී උපයෝගී කර ගත හැක.

මුදලට හෝ යම් ප්‍රතිෂ්ඨාවක් මත ලිංගික කටයුතු වල යෙදීම නැතහොත් යෙදවීම සහ සදාචාරාත්මක කරුණු සම්බන්ධයෙන් විවිධ නීති ශ්‍රී ලංකා නීති පද්ධතිය තුළ ඇත. තවද, ඊට අදාළ අපරාධ නීතියේ මූලාශ්‍රය වන දණ්ඩ නීති සංග්‍රහයට 1995, 1998, 2006 යන වර්ෂ වලදී ගෙන එන ලද සංශෝධන වලින්ද විශේෂ නීති තත්වයන් හඳුන්වා දී ඇත. දණ්ඩ නීති සංග්‍රහයට අමතරව ඇති වැදගත්ම ප්‍රතිපාදනය වන්නේ පාදඩ ආඥා පනත සහ ගණිකා නිවාස ආඥා පනතයි.

සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් සම්බන්ධව ඔවුන් විසින් මුහුණ දෙන සාමාජීය, ආර්ථික සහ නීතිමය වශයෙන් ඇතිවන විවිධ ගැටළු අවම කිරීම සඳහා අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග පිළිබඳව උපදෙස් මානව හිමිකම් කොමිෂන් සභාවේ මැදිහත් වීම මත සෞඛ්‍ය අමාත්‍යංශය සහ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තුමේන්තුව විසින් 2016 වසරේදී චක්‍ර ලේඛන මගින් ප්‍රකාශයට පත් කර ඇත.

## පාදඩ ආඥා පනත

මෙම ආඥා පනත බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී පාලකයන් විසින් ඉංග්‍රීසි නීතිය යටතේ (වර්ෂ 1841 දී) හඳුන්වා දෙන ලද මුල්ම ව්‍යවස්ථා වලින් එකකි. එහි දීර්ඝ නාමය ලෙස සඳහන් කර ඇත්තේ පාදඩයන්ට එරෙහිව පනවා ඇති නීති සංශෝධනය සඳහා ගෙන එන ලද පනතක් බවයි. මෙම පනතට අනුව වාණිජමය ලිංගික ව්‍යාපාර සහ ඊට අනුරූප වැරදි සම්බන්ධයෙන් අදාළ වන වගන්ති කිහිපයකි.

### 03 වන වගන්තියඃ

අ) තමාගේ යැපීම් මාර්ගයන් සලසා ගැනීමට හැකියාවක් තිබිය දී ඒ පිළිබඳ සැලකිල්ලක් නොදක්වා යම් ප්‍රසිද්ධ ස්ථානයක, වීදියක, මහා මාර්ගයක සිඟා කෑම සිදු කරන තැනැත්තෙකු,

ආ) මංමුලා වී ප්‍රසිද්ධ වීදියක හෝ මහා මාර්ගයක ඇවිදින සෑම ප්‍රසිද්ධ ගණිකාවක් හෝ වීදියක හෝ ඕනෑම මහජනයා ගැවසෙන ස්ථානයක අශිෂ්ට හෝ අශීලාචාර ලෙස හැසිරෙන යම් තැනැත්තෙකු,

ඇ) තැන තැන ඇවිදින, එමෙන්ම තමා ගැන යම් විස්තරයක් කීමට අපොහොසත් වන නැතහොත් අයිතිකරුවෙකුගේ කැමැත්ත නොමැතිව ගෙයක, අගුපිලක, එළි පත්තක රැඳී සිටින තැනැත්තෙකු හෝ ඔහු ගැන හොඳ විස්තරයක් නොදෙන අයෙකු,

ඈ) අයිතිකරුවෙකුගේ අවසරයක් නොමැතිව පත්‍රිකා හෝ දැන්වීම් ඇලවීම, අශීලාචාර හෝ අපහාසාත්මක ලෙස යමක් ලිවීම, චිත්‍ර ඇඳීම මඟින් ගොඩනැඟිල්ලක් හෝ තාප්පයක් අවලස්සන කරන තැනැත්තෙකු,

මෙම වගන්තිය යටතේ වරදකරු වේ.

**සිසිලිහාමි එදිරිව සොයිසා 47 එන්.එල්.ආර් 311** නඩුවේ දී අධිකරණය ප්‍රකාශ කලේ 3(අ) වගන්තිය යටතේ ජීවිකාව කරගෙන යාමට පෙනෙන තරම් මාර්ගයක් නැති පුද්ගලයෙකු බව පැමිණිල්ල විසින් ඔප්පු කළ යුතු බවයි.

## 04 වන වගන්තිය:

අ) මැරයෙකු හෝ පාදඩයෙකු ලෙස සලකනු ලබන්නේ වීදියක, මහා මාර්ගයක, ප්‍රසිද්ධ ස්ථානයක හෝ අන් තැනක අන් අයට අප්‍රසන්නතාවයක් හෝ පිළිකුලක් ඇතිවන ලෙස ඕනෑකමින්ම, අශීලාචාර ලෙස තම අඟපසඟ පෙන්නුම් කරන හෝ අසභ්‍ය පින්තූර ආදිය ප්‍රදර්ශනය කරන හෝ අනෙකුත් අසභ්‍ය දේ ප්‍රදර්ශනය කරන ඕනෑම පුද්ගලයෙකු වේ.

**චාර්ලිස් අප්පුහාමි එදිරිව සෙනෙවිරත්න 65 එන්.එල්.ආර් 455** නඩුවේ දී "අන් තැනක" යන අර්ථය ප්‍රසිද්ධ ස්ථානයක් හැර ඕනෑම ස්ථානයක් බවට තීරණය කර ඇත. මෙම අර්ථ නිරූපනය අනුව ප්‍රසිද්ධ නොවන ස්ථානයකදී වුවද මෙම ක්‍රියා සිදු කිරීම වරදකි.

## 07 වන වගන්තිය:

අ) යමෙක් ප්‍රසිද්ධ ස්ථානයකදී, යම් පුද්ගලයෙකුට නීති විරෝධී කාමුක සංසර්ගයේ යෙදීම හෝ අශෝභන ක්‍රියා වල යෙදීම සඳහා ආයාචනා කරයි නම්, වරදක් සිදු කරයි.

**ධර්මදාස එදිරිව තියඩෝමන් 56 එන්.එල්.ආර් 278** හි දී ආයාචනා කිරීම යන්න කැමැත්තෙන් හෝ බලපෑමෙන් එම ආයාචනය කළ බවට සීමා කිරීම අවශ්‍ය නොවන බව ප්‍රකාශිතව හෝ අනුමිතිව හෝ ආයාචනා කිරීම දක්වා පුළුල් ස්වරූපයක් දරන බවත් පෙන්වා දී ඇත.

මේ අනුව යම් පුද්ගලයෙකුට කාමුක සංසර්ගය සඳහා ආරාධනා කරන තැනැත්තියක් අත්අඩංගුවට ගත හැක. මෙම ආරාධනාව ප්‍රකාශිතව හෝ ව්‍යංගව සිදු කළ හැක. ඉඟිබිඟිපෑමක් වුවද ප්‍රමාණවත් වන බව මෙම නඩු තීන්දුව අනුව පැහැදිලි වේ.

**ලීම් බුග්‍රන් එදිරිව සිල්වා 34 එන්.එල්.ආර් 56** හි දී නීති විරෝධි යන්න සාමාන්‍ය චරිතය පිළිබඳ මිම්මට විෂමතා, නොහොබිනා යන අර්ථය දෙනු ලබන බව ප්‍රකාශ කරන ලදී.

ආ) ප්‍රසිද්ධ ස්ථානයක හෝ ඒ අසල බරපතල අශෝභන ක්‍රියා සිදු කරමින් හෝ බරපතල අශෝභන ලෙස හැසිරෙනු ලබයි නම් එවැනි පුද්ගලයෙකු වරදක් කරයි.

## 09 වන වගන්තිය:

කිසියම් පුද්ගලයෙකු,

1) සම්පූර්ණයෙන්ම ගණිකා වෘත්තියෙන් හෝ ඉන් කොටසකින් මුදල් උපයාගෙන ඒ බව දනිමින්ම ජීවත් වන තැනැත්තෙකු වරදක් කරයි.

2) නීති විරෝධි හෝ අස්වාභාවික සංසර්ගයට ක්‍රමානුකූලව පුද්ගලයින් සපයා දෙන්නේ නම් එවැනි තැනැත්තෙකු වරදක් කරයි.

## 11 වන වගන්තිය:

1) තමා භාරයේ සිටින ගැහැණු ළමයෙකු කන්‍යා දූෂණයට, ගණිකා වෘත්තියට, නීති විරෝධි මෛථුන්දමකට යොමු කරන්නේ නම් අදාළ එවැනි පුද්ගලයෙකු,

2) කන්‍යා දූෂණයට ලක්ව හෝ ගණිකා වෘත්තියට හෝ නීති විරෝධි මෛථුන්දමකට ලක් වූ ගැහැණු ළමයෙකුට තවදුරටත් එම ක්‍රියාව කරගෙන යාමට ඉඩදීම හෝ උදව් කිරීම හෝ ධෛර්ය දීම නැතහොත් ගණිකාවක් හෝ දුෂ්ඨ චරිතයක් ඇති පුද්ගලයෙකු ඇසුරු කරන යම් තැනැත්තෙකු,

ආඥා පනත දෙස බැලූ විට පැහැදිලි වන කාරණයක් නම් එහි 03, 07, 09 යන වගන්ති වාණිජමය ලිංගික ක්‍රියා සම්බන්ධයෙන් අනුකූල වන බවයි. මේ අනුව, පාදඩ ආඥා පනත යටතේ වාණිජමය ලිංගික කටයුතු වල යෙදෙන හෝ එවැනි ව්‍යාපාර වලට සම්බන්ධ අයවලුන් අත්අඩංගුවට ගැනීමේදී 3, 4, 7, 9 සහ 11 වගන්ති වල ඇති ප්‍රතිපාදන යටතේ ක්‍රියාකල යුතුය.

විශේෂයෙන්ම 3(අ) වගන්තිය අනුව මංමුලා වී ප්‍රසිද්ධ වීදියක හෝ මහා මාර්ගයක ඇවිදින සෑම ප්‍රසිද්ධ ගණිකාවක්ම අත්අඩංගුවට ගත හැකි බව සඳහන්ව ඇත. එසේ වුවද, ප්‍රශ්නය වන්නේ ගණිකාව යන්න පනතට අනුව නිර්වචනය කර නොමැති වීමයි. එම නිසා හුදු සැකය නිසා හෝ විශ්වාසය මත අත්අඩංගුවට ගැනීම සිදු නොකළ යුතු අතර වගන්තියේ පදානුගත අර්ථයට අනුව අදාළ කාන්තාව ගණිකාවක් බවට ඔප්පු කිරීමට තරම් ප්‍රමාණවත් සාධක තිබිය යුතුය.

## ගණිකා නිවාස ආඥා පනත

පාදඩ ආඥා පනත පැනවීමෙන් අවුරුදු 48 කට පසුව අධිරාජ්‍යවාදී පාලකයන් විසින් 1889 ජුනි 28 වන දින මෙම ආඥා පනත ක්‍රියාවට නැංවිනි.

### 02 වන වගන්තිය:

ගණිකා නිවාසයක් පවත්වා ගෙන යාම හෝ පාලනය කිරීම, පවත්වා ගෙන යාමට සහය වීම වරදකි.

යම් නිවසක ගණිකාවන් ලෙස ස්ත්‍රීන් තබා ගෙන සිටිමින් ඔවුන් මුදලට ලිංගික ක්‍රියා වල යෙදවීම් සිදු කරයි නම් ඒ ක්‍රියා සිදු කරන තැනැත්තා මෙම වගන්තිය යටතේ වරදකරුවෙකු වේ.

**තුසේන් එදිරිව සිසිලියා 37 එන්.එල්.ආර් 308** නඩුවේ දී සුවිස් විනිසුරු ප්‍රකාශ කලේ ගණිකා නිවාසයක් බවට පත්වීමට නම්, කාන්තා ඇසුර පතා මිනිසුන් නිරන්තරයෙන් ගැවසෙන ස්ථානයක් විය යුතු බවයි.

ආඥා පනතේ කිසිදු තැනක ගණිකා නිවාසයක් යන්න අර්ථ නිරූපන කොට දක්වා නොමැත.

**ඩොරති සිල්වා එදිරිව පිටකොටුව දුෂණ මර්දන අංශයේ ස්ථානාධිපති 78 එන්.එල්.ආර් 433** නඩුවේ දී පහත පරිදි ගණිකා නිවාසයක් යන්න අර්ථ නිරූපනය කර ඇත.

"සල්මල්" නමින් වැල්ලවත්ත ප්‍රදේශයේ පවත්වා ගෙන ගිය ව්‍යාපාරික ස්ථානය බැලූ බැල්මට පෙනෙන්නට වූයේ මල් විකුණන වෙළෙඳසැලක් ලෙසයි. නමුත් එහි හිමිකාර කාන්තාව, කාන්තාවන්ගේ කලු සුදු, අඩ නිරුවත් ඡායාරූප ඇල්බමයක් පවත්වාගෙන යමින් එහි පැමිණෙන අයෙකු එම ඡායාරූප ඇල්බමයෙන් යම් කාන්තාවක් තෝරා ගත් පසු මුදල් එම ස්ථානයට ගෙවීමෙන් අනතුරුව, මුදල් ගෙවන්නා නම් කරන හෝටලයකට ඔහු විසින් තෝරා ගත් කාන්තාව යැවීම සල්මල් ව්‍යාපාරයේ ප්‍රධාන ව්‍යාපාරික කටයුත්ත විය.

මේ පිළිබඳව උපාය දූතයෙකු යොදා ස්ථානාධිපති පිටකොටුව දුෂණ මර්දන අංශය සාර්ථක වැටලීමක් සිදුකර අධිකරණයට පැමිණිල්ල ගොණු කළ පසු ගණිකා නිවාස ආඥා පනතේ 2 වන වගන්තියේ සඳහන් වරදේ නෛතික මූලිකාංග ඔප්පු වී නොමැති නිසා චූදිතයන් නිදොස් කොට නිදහස් කර ඇත.

මේ පිළිබඳ අභියාචනයක් ඉදිරිපත් කළ අතර, එහිදී ඒකමතික තීරණය වූයේ සල්මල් ව්‍යාපාරික ස්ථානයේ සත්‍ය වශයෙන්ම, ජීවමානව, ප්‍රායෝගිකව, එම අවස්ථාවේ කාන්තාවන් සැපයීම සිදු නොවන නමුත්, මෙම සමස්ථ ක්‍රියාවලිය එක්ව ගෙන අර්ථ නිරූපනය කිරීමේදී ගණිකා නිවාස ආඥා පනත යටතේ සඳහන් කාන්තාවක් මුදලට සැපයීමේ වරද සංස්ථාපනය වී ඇති බවයි.

ඒ අනුව ගණිකා නිවාස ආඥා පනතේ 02 වන වගන්තියේ කුමක් සඳහන් වුවද, එම ස්ථානයේදීම හෝ වෙනත් ස්ථානයකදී ගණිකා වෘත්තියේ යෙදීම, අශිෂ්ට ක්‍රියා හෝ ලිංගික සංසර්ගය පිණිස, එම ස්ථානයේ හෝ වෙනත් ස්ථානයක සිටින ස්ත්‍රීන් සපයන, හෝ පින්තූර පෙන්වා කාන්තාවන් වෙනත් ස්ථානයකට සපයන ස්ථානයක් ගණිකා නිවාසයක් බවට තීරණය කර ඇත.

**ඩැනී එදිරිව පොලිස් පරීක්ෂක සිරි නිමල් සිල්වා එස්.සී අයදුම්පත් අංක 488/98** නඩුවේ දී ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශ කලේ ගණිකා නිවාස ආඥා පනත යටතේ යම් තැනැත්තෙකු වරදකරු කිරීමට නම් අදාළ පුද්ගලයා ගණිකා නිවාසය පාලනය කළ බවට හෝ පාලකයාට සහය වූ බවට පැහැදිලි සාක්ෂි තිබිය යුතු බවයි. එසේ නොමැතිව ගණිකා නිවාස පනත යටතේ පුද්ගලයන් අත්අඩංගුවට ගැනීම මූලික අයිතිවාසිකම් කඩ කිරීමක් බවට සඳහන් කර ඇත. එම නඩුවේ කරුණු පහත පරිදි වේ.

හලාවත පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් 1998 ජූලි මස 23 වන දින දංකොටුව ප්‍රදේශයේ “සිරි සෙවණ” නම් නවාතැන්පලක් වටලා එම ස්ථානයේ රැඳී සිටි පෙත්සම්කරු සහ ඔහුගේ පෙම්වතියත්, සෙසු කාමර වල සිටි පිරිමින් 04ක් සහ කාන්තාවන් 06 දෙනෙකු අත්අඩංගුවට ගෙන, ඔවුන්ට එරෙහිව ගණිකා නිවාස ආඥා පනත යටතේ මාරවිල මහෙස්ත්‍රාත් උසාවියේ නඩු පවරා ඇත. මෙම ක්‍රියාදාමය අභියෝගයට ලක් කරමින්, ගරු ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම යොමු කර තිබූ අතර පෙත්සම්කරුගේ සහ වග උත්තරකරුවන්ගේ නෛතික ස්ථාවරයන් සලකා බැලීමෙන් අනතුරුව අධිකරණය තීරණය කලේ ගණිකා නිවාස ආඥා පනත යටතේ ගණිකා නිවාසයකට නවාතැන් පලක් ඇතුළත් නොවන බවයි.

මෙහිදී ගණිකා නිවාසයකදී ගණිකා වෘත්තියේ යෙදෙන කාන්තාවකගේ නෛතික තත්වය විස්තර කර ඇත. එලෙසම අබේකෝන් එදිරිව කුලතුංග නඩුවේදී නාගලිංගම් විනිසුරු දක්වා ඇති කරුණුද ගෙන හැර දක්වා ඇත. එහිදී නාගලිංගම් විනිසුරුවරයා සඳහන් කර ඇත්තේ යම් කාන්තාවක් ගණිකා නිවාසයකදී ලිංගික අවශ්‍යතාවයක් සංතර්පණය කර ගැනීම සඳහා පැමිණෙන පුද්ගලයන්ට තම ශරීරය පිරිනැමූ පමණින් ගණිකා නිවාස ආඥා පනත යටතේ වරදක් නොකරන බවයි.

වරදක් වන්නේ ගණිකා නිවාසයක් පවත්වා ගෙන යාම හෝ පාලනය කිරීමයි. තවද යම් පුද්ගලයෙකුට ගණිකා නිවාස ආඥා පනත යටතේ චෝදනා එල්ල කිරීමට නම් ඔහු හෝ ඇය එකී ගණිකා නිවාසය කළමනාකරණය කළ බවට හෝ පවත්වා ගෙන ගිය බවට සාක්ෂි තිබිය යුතුය. එසේ නොමැතිව තම පෙම්වතිය සමඟ රැය පහන් කිරීමට නවාතැන්පලකට ගිය අයෙකුට එරෙහිව මෙම ආඥා පනත යටතේ කටයුතු කළ නොහැකි බව සඳහන් කර ඇත.

මෙම ආඥා පනත් දෙකම පනවා ඇත්තේ 19 වන ශත වර්ෂයේදී ය. මෙම ව්‍යවස්ථා පැන වූවාට පසුව ලෝකයේ පුද්ගල අත්අඩංගුවට ගැනීම්, වෘත්තීමය අයිතිවාසිකම්, රඳවා තබා ගැනීම් පිළිබඳ විවිධ සම්මුතීන් ජාත්‍යන්තර නීතිය තුළ වර්ධනය වී ඇත. එම වර්ධනයන් දේශීය නීතිය තුළද අන්තර්ගත වී ඇති අතර, විශේෂයෙන්ම 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදයේ මේ පිළිබඳව සඳහන්ව ඇත. ඒ අනුව මෙම ආඥා පනතේ සඳහන් නීති ක්‍රියාත්මක කිරීමේදී ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදයේ ඇති 11, 13(1), 13(2) ව්‍යවස්ථා කෙරෙහිද අවධානය යොමු කළ යුතුය.

## කොන්ඩමය

කොන්ඩමයක් ලග තබා ගත් කාන්තාවක් පාදඩ ආඥා පනතේ සඳහන් ප්‍රසිද්ධ ස්ථානයක, මහා මාර්ගයක හෝ වීදියක දී අත් අඩංගුවට ගැනීම විවිධ අවස්ථා වලදී ප්‍රශ්නකාරී වී ඇත. කොන්ඩමයක් ලඟ තබා ගැනීම පමණක් මෙම පනත යටතේ අත්අඩංගුවට ගැනීමට හේතු සාධක නොවේ. කොන්ඩමයක් වෛද්‍ය උපාංගයක් ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශයේ අත්‍යවශ්‍ය ඖෂධ ලැයිස්තුවේ සඳහන් කර ඇත. එම නිසා කොන්ඩම් ළඟ තබා ගැනීම කිසියම් වරදක් සිදු කල බවට ඔප්පු කිරීමට අධිකරණයට ඉදිරිපත් කළ හැකි හෝ කල යුතු භාණ්ඩයක් නොවේ.

## ස්ත්‍රී පුරුෂ සමාජභාවය

පුද්ගලයෙකුගේ ලිංගික අවයව වල පිහිටීම අනුව තීරණය වන ලිංගිකත්වය ජීව විද්‍යාත්මක ලිංගිකත්වය ලෙස හඳුන්වයි. උපතේදී මේ අනුව ගැහැණු හෝ පිරිමි ලෙස කොටස් දෙකකට වෙන් කෙරේ. සමාජය මෙම පිරිමි සහ ගැහැණුන්ගෙන් එකිනෙකාට වෙනස් හැසිරීම් බලාපොරොත්තු වේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන යෙදුමෙන් අදහස් කරන්නේ සම්ප්‍රදායිකව සම්මතයන් සහ අපේක්ෂාවන්ට අනුකූලව ජීව විද්‍යාත්මක ලිංගිකත්වයන්ට පවරා ඇති සමාජීය භූමිකාවයි.

## සංක්‍රාන්තික ලිංගිකයන්/ සංක්‍රාන්ති සමාජභාවී

සංක්‍රාන්තික ලිංගිකයන් යනු ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ඔවුන්ගේ අභ්‍යන්තර සංවේදීතාවය තමන් උපතින් ලැබූ ලිංගිකත්වයෙන් වෙනස්ව දැනෙන සියලුම පුද්ගලයන් සඳහා යොදනු ලබන පුළුල් යෙදුමෙකි. මෙම සංක්‍රාන්තික ලිංගික ප්‍රජාවට සංක්‍රාන්තික ලිංගික පිරිමින් සහ සංක්‍රාන්තික ලිංගික කාන්තාවන් ප්‍රධාන වශයෙන් අයත් වේ. සංක්‍රාන්තික ලිංගික ප්‍රජාව අතරින් බහුලවම දක්නට ඇත්තේ සංක්‍රාන්තික ලිංගික කාන්තාවන්ය. සංක්‍රාන්තික ලිංගික කාන්තාවක් යනු උපතින් පුරුෂ ලිංගික අයකු ස්ත්‍රියක් ලෙස තම අනන්‍යතාවය ප්‍රකාශ කරන පුද්ගලයෙකුය.

මෙම සංක්‍රාන්ති ලිංගිකභාවය රෝගී භාවයක් නොවන බව වෛද්‍ය විද්‍යාත්මකව පිළිගෙන ඇත.

සංක්‍රාන්ති ලිංගික පුද්ගලයන් බොහෝ විට සමාජීය, ආර්ථික, දේශපාලනික සහ නීතිමය වශයෙන් කොන් කිරීම් සහ වෙනස්කොට සැලකීම් වලට ලක්වේ. ඔවුන් ශාරීරික සහ ලිංගික වදහිංසනවලට භාජනය වේ. එමෙන්ම ගිමන්හල්, පොදු වැසිකිලි වැනි ස්ථාන වලට පිවිසීමේදී කොන් කිරීම් වලට ලක් වේ.

සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා උප්පැන්න සහතිකයේ ඇති ස්ත්‍රී පුරුෂභාවය සංශෝධනය කිරීම මගින් අදාළ පුද්ගලයාගේ ලිංගික අනන්‍යතාවය නීත්‍යානුකූලව නිවැරදිව උප්පැන්න සහතිකයේ සටහන් කිරීම සහ එමගින් ඔවුන්ගේ අනෙකුත් අනන්‍යතා සහ නීතිමය ලේඛන ලබා ගැනීම සඳහා සෞඛ්‍ය අමාත්‍යංශය සහ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව චක්‍ර ලේඛන නිකුත් කර ඇත.

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 01-34/ 2016 චක්‍ර ලේඛනය (ඇමුණුම 01) අනුව සංක්‍රාන්ති ලිංගික පුද්ගලයන් සඳහා අවශ්‍ය සේවා සඳහා රජයේ රෝහල් වල විශේෂඥ මනෝ වෛද්‍ය සේවාවන් පවත්වනු ලබයි. යම් පුද්ගලයකු මෙම සේවාව ඉල්ලුම් කල විට අදාළ මනෝ වෛද්‍ය විශේෂඥවරයා විසින් එම පුද්ගලයා තක්සේරු කිරීම, උපදේශන සේවා සහ උප්පැන්න සහතිකයේ ස්ත්‍රී පුරුෂභාවය වෙනස් කිරීමට අවශ්‍ය "ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිගැනීම සඳහා වූ සහතිකය" (සෞ 1257 ලේඛනය) නිකුත් කිරීම ආදී සේවා සපයනු ලබයි (ඇමුණුම 02). මෙම සම්පූර්ණ සායනික ක්‍රියාවලිය සඳහා මාස 6 ක සිට අවුරුද්දක පමණ කාලයක් ගත වේ.

මෙම "ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිගැනීම සඳහා වූ සහතිකය" ලිඛිත සාක්ෂියක් ලෙස ගොනු කර සංක්‍රාන්ති ලිංගිකයන්ගේ උප්පැන්න සහතිකයේ නම සහ ස්ත්‍රී/පුරුෂ භාවය සංශෝධනය කිරීමට රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අංක 06/2016 දරන චක්‍ර ලේඛනය මගින් අදාළ අංශ/බලධාරීන් වෙත දැනුම් දී ඇත (ඇමුණුම 03).

උප්පැන්න සහතිකයේ නම සහ ස්ත්‍රී/පුරුෂ භාවය සංශෝධනය කිරීමෙන් අනතුරුව ජාතික හැඳුනුම් පත් වෙනස් කිරීම, අධ්‍යාපන සහතික වෙනස් කිරීම ආදී සශෝධනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග සඳහා අයදුම් කල හැක.

# ඇමුණුම 01

පොදු චක්‍රලේඛ අංක: 01 - 34 /2016

මගේ අංකය: DMH/A/18/2016

සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත

කොළඹ 10.

2016.06. 16

සියලුම පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්
සියලුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
සියලුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
සියලුම ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂවරුන්
සියලුම වෛද්‍ය අධිකාරීවරුන්
සියලුම විශේෂිත ව්‍යාපාර සහ වැඩසටහන් ප්‍රධානීන්
සියලුම වෛද්‍ය විද්‍යාල කුලපතිවරුන්
සියලුම ආයතන ප්‍රධානීන්

**සංක්‍රාන්තික ලිංගික ප්‍රජාව සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිගැනීම සඳහා වූ සහතිකය නිකුත් කිරීම**

සංක්‍රාන්තික ලිංගිකයන් යනු ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ඔවුන්ගේ අභ්‍යන්තර සංවේදීතාවය තමන් උපතින් ලැබූ ලිංගිකත්වයෙන් වෙනස්ව දැනෙන සියලුම පුද්ගලයන් සඳහා යොදනු ලබන පුළුල් යෙදුමකි. උදාහරණයක් ලෙස සංක්‍රාන්තික ලිංගික ස්ත්‍රියක් ලෙස හඳුන්වන්නේ උපතින් පුරුෂ ලිංගික අයකු ස්ත්‍රියක් ලෙස හැඳින්වීමය.

සංක්‍රාන්තික ලිංගික පුද්ගලයන් බොහෝවිට සාමාජීය, ආර්ථික, දේශපාලනික සහ නීතිමය වශයෙන් කොන් කිරීම්වලට ලක්වේ. ඔවුන් නොසලකා හැරීම, කරදර හිරිහැරවලට ගොදුරුවීම, ප්‍රචණ්ඩත්වයට, ලිංගික වද හිංසනයට ලක්වීම සහ ගිමන්හල්, චිත්‍රපට ශාලා, පොදු වැසිකිළි වැනි පොදු ස්ථානවලට පිවිසීමේදී කොන් කිරීම් ආදිය බහුලව සිදුවේ. මේ නිසා උප්පැන්න සහතිකයේ දක්වා ඇති ලිංගික නිශ්චය සංශෝධනය කිරීම සංක්‍රාන්තික ලිංගික පුද්ගලයෙකු සඳහා ඉතා වැදගත් පියවරකි. මෙම නීත්‍යානුකූල ලේඛනයේ පුද්ගලයාගේ ලිංගික අනන්‍යතාවය නිවැරදිව සටහන් කිරීම තුළින් අනෙකුත් අනන්‍යතා හා නීතිමය ලේඛන ලබා ගැනීමේදී ස්ත්‍රී පුරුෂ භාවය සනාථ කිරීමට හැකිවේ.

ඉහත දක්වා ඇති කරුණු සැලකිල්ලට ගනිමින් සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මෙම සංක්‍රාන්තික ලිංගික ප්‍රජාව සඳහා අවශ්‍ය සේවා, විශේෂඥ මනෝ වෛද්‍ය සේවාවන් සපයන සියලුම ආයතනයන්හි ස්ථාපිත කිරීමට තීරණය කර ඇත.
යම් පුද්ගලයෙකු මෙම සේවාව ඉල්ලුම් කළ විට අදාළ වගකිව යුතු විශේෂඥ මනෝ වෛද්‍යවරයා/වරිය විසින් එම පුද්ගලයා පිළිබඳ තක්සේරු කිරීම, උපදේශනය සහ උප්පැන්න සහතිකයේ ස්ත්‍රී පුරුෂ භාවය වෙනස් කිරීමට අවශ්‍ය ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිගැනීම සඳහා වූ සහතිකය නිකුත් කිරීම ආදී සේවාවන් සැපයීම සිදු කරනු ලැබේ. මෙම සහතිකය නිකුත් කරනු ලබන්නේ වයස අවුරුදු 16 ට වැඩි පුද්ගලයන් සඳහා පමණක් වන අතර එහි එම පුද්ගලයාගේ උප්පැන්න සහතිකයේ දැක්විය යුතු ස්ත්‍රී පුරුෂ භාවය සඳහන් කරනු ඇත.

මෙම සහතිකය සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති රෝහලක සේවය කරන විශේෂඥ මනෝ වෛද්‍යවරයෙකු/වරියක විසින් සහතික කළ එම පසු ආයතනයේ ප්‍රධානියා විසින් ද සහතික කළ යුතුය. යම් පුද්ගලයෙකු පුද්ගලික ආයතනයක් මඟින් ඉල්ලුම් කළ විට එම සහතිකය ලබා ගැනීම සඳහා විශේෂඥ මනෝ වෛද්‍යවරයෙකු/වරියක සිටින ආසන්නතම රජයේ රෝහලට යොමු කළ යුතුය.

සංක්‍රාන්තික ලිංගික තොරතුරු කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම; මෙම සේවාවන් ඵලදායී ලෙස අධීක්ෂණය සඳහා එම ආයතනයන්හි ලේඛනයක් පවත්වාගෙන යා යුතු වේ.
සෞඛ්‍ය අමාත්‍යාංශයේ මානසික සෞඛ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය විසින් සංක්‍රාන්තික ලිංගික පුද්ගලයන්ගේ තොරතුරු කළමනාකරණ ක්‍රමවේදයක් සඳහා දැනට පියවර ගනිමින් පවතින අතර ඒ සඳහා පහත සඳහන් ප්‍රධාන ලේඛන 2ක් පවත්වාගෙන යා යුතු වේ.

- සංක්‍රාන්තික ලිංගික පුද්ගලයන් පිළිබඳ දැනුම් දීමේ ලේඛනය (Transgender Notification Register – TNR);
  යම් පුද්ගලයෙකු වෙත ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිගැනීම සඳහා වූ සහතිකයක් නිකුත් කළ විට අදාළ අයගේ නම, උපන්දිනය, උපතින් ලද ස්ත්‍රී පුරුෂ භාවය, ඉල්ලුම් කරන ස්ත්‍රී පුරුෂ සමාජ භාවය, ජාතික හැඳුනුම්පත් අංකය, ඇද ඉහපත් අංකය/සායනික අංකය යනාදී විස්තර මෙම ලේඛනයේ ඇතුළත් කළ යුතුය. මෙම ලේඛනය එම ආයතනයේ මානසික සෞඛ්‍ය ඒකකයේ පවත්වාගෙන යා යුතුය.

- ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිගැනීම සඳහා වූ සහතිකය (Gender Recognition Certificate – GRC);
  මෙය පිටපත් 3කින් සකස් කළ යුතුය. එක් පිටපතක් ඉල්ලුම් කරන අයටද, දෙවන පිටපත ආයතනයේ තබා ගැනීම සඳහා ද වන අතර තෙවන පිටපත සෞඛ්‍ය අමාත්‍යාංශයේ මානසික සෞඛ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය වෙත යැවිය යුතුය.

සංක්‍රාන්තික ලිංගික ප්‍රජාවට අවශ්‍ය සේවාවන් ශක්තිමත් කර, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සහතික පත නිකුත් කිරීම සඳහා ඔබ ආයතනයේ විශේෂඥ මනෝ වෛද්‍ය නිලධාරීන් සහ අනිකුත් අදාළ නිලධාරීන් දැනුවත් කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටින අතර ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිගැනීම සඳහා වූ සහතික පත්‍රයේ පිටපතක් සහ දැනුම් දීමේ ලේඛනයේ ආකෘතියක් ඔබගේ දැනගැනීම සඳහා මේ සමඟ අමුණා ඇත. වැඩි විස්තර සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ මානසික සෞඛ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය වෙතින් ලබා ගත හැක.

වෛද්‍ය පී. ජී. මහීපාල
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

.........................................

වෛද්‍ය පී.ජී මහීපාල

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:

ලේකම් / සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වෛද්‍ය සේවා) I
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වෛද්‍ය සේවා) II
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (බෝ නොවන රෝග)
අධ්‍යක්ෂ / මානසික සෞඛ්‍ය
සභාපති / ශ්‍රී ලංකා මනෝ වෛද්‍ය විශේෂඥ සංගමය

# ඇමුණුම 02

සෞ.1257

**ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පිළිගැනීම සඳහා වූ සහතිකය**

**සෞඛ්‍ය අමාත්‍යාංශය - ශ්‍රී ලංකාව**

*මෙම සහතිකය නිකුත් කරනු ලබන්නේ උප්පැන්න සහතිකයේ සඳහන් කර ඇති ස්ත්‍රී පුරුෂ භාවය සහ නම වෙනස් කිරීම සඳහා උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ ලේඛන ආඥා පනතේ ඇති 27 සහ 52(1) කොටසට අදාළවය.*

A. සාමාන්‍ය තොරතුරු

1. සම්පූර්ණ නම : ..................................................................................
..................................................................................
2. පියාගේ නම : ..................................................................................
3. මවගේ නම : ..................................................................................
4. පදිංචි ලිපිනය : ..................................................................................

5. ජාතික හැඳුනුම්පත් අංකය : ....................................................................
6. උපතේදී ස්ත්‍රී පුරුෂ භාවය : පුරුෂ/ස්ත්‍රී (අදාළ භාවය යටින් ඉරක් යොදන්න)
7. උපන් දිනය : .............................................. උපන් ස්ථානය : ..............................................
8. ලියාපදිංචි අංකය : .............................................. දිනය : ..............................................

**B. ස්ත්‍රී පුරුෂ සමාජභාවය සඳහා වූ ප්‍රකාශනය**

..................................................................................

(තනතුර)..................................................................................

.............................................. (සම්පූර්ණ නාම) වන මා ඉහත නම් සඳහන් පුද්ගලයා ස්ත්‍රී පුරුෂ සමාජභාවයෙහි නැවත පිහිටුවීම සඳහා ඔහු/ඇය ගේ මානසික තත්වය තක්සේරු කරන ලද බව මෙයින් ප්‍රකාශ කර සිටිමි. ඒ අනුව ලෝක සෞඛ්‍ය සංවිධානයේ රෝගාබාධ සඳහා වන අන්තර්ජාතික වර්ගීකරණයේ 10 වන සංස්කරණයෙහි නිර්ණායකවලට අනුව පුරුෂ/ස්ත්‍රී භාවයේ සිට ස්ත්‍රී/පුරුෂ භාවයට ලිංග පරිවර්තනයක් සිදු වී ඇති බවට මම (රෝග) නිශ්චය කරමි.

ඉහත නාම සඳහන් අයගේ සායනික අවශ්‍යතාවයන්ට සහ ස්ත්‍රී පුරුෂ සමාජ භාවය විදහා දැක්වීමේ අරමුණුවලට ගැළපෙන පරිදි ඉහළම රැකවරණය සැපයීම සඳහා සමස්ත ප්‍රතිකාර සැලැස්මේ හඳුනාගත් වැදගත් කරුණු සම්බන්ධයෙන් ඔහු/ඇය දැනුවත් කරන ලදී.

අවශ්‍ය ක්‍රියාදාමයෙන් පසුව ඉහත සඳහන් අය හෝර්මෝන ප්‍රතිකාර සහ අවශ්‍ය ශල්‍ය ප්‍රතිකාර සඳහා යොමු කරන ලදී.

ඉහත නම් සඳහන් අය, සංක්‍රාන්තික ලිංගික පුද්ගලයන් සඳහා ලෝක වෘත්තිකයන්ගේ සංගමය විසින් ප්‍රකාශිත රැකවරණය පිළිබඳ ජාත්‍යන්තර වශයෙන් හඳුනාගත් සහ පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ඒ හා බැඳුණු සමාජීය භූමිකාවලට අනුකූල වන ලෙස පරිවර්තන ක්‍රියාදාමයට භාජනය කරන ලද බවට සහතික වෙමි.

තවද ඉහත නම සදහන් අයගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය ........../........./......... දින .............. භාවයේ සිට ......................භාවයට වෙනස් කළ බව ප්‍රකාශ කර සිටින අතර, පහත දක්වා ඇති පරිදි උප්පැන්න සහතිකයෙහි ස්ත්‍රී පුරුෂ භාවය සහ නම වෙනස් කිරීම සඳහා අයදුම් කිරීමට සුදුසුකම් සපුරා ඇති බව දන්වා සිටිමි.

පරිවර්තනයෙන් පසු භාවිතා කරන නම : ..............................................................................

..............................................................................................................................

පරිවර්තනයෙන් පසු ස්ත්‍රී පුරුෂ භාවය භාවය : ..............................................................................

| | |
|---|---|
| නම : ............................................................ | ............................................................ |
| අත්සන : ............................................................ | ............................................................ |
| (විශේෂඥ මනෝ වෛද්‍ය) | (ආයතන ප්‍රධානියා) |
| ........................................................ | ........................................................ |
| (රාජකාරි නිලමුද්‍රාව) | (රාජකාරි නිලමුද්‍රාව) |
| ........................................................ | ........................................................ |
| (දිනය) | (දිනය) |

# ඇමුණුම 03

චක්‍රලේඛ අංකය : 06/2016

මගේ අංකය / எனது இல. / My No. RG/MBD/01/2012

ඔබේ අංකය / உமது இல. / Your No.

දුරකථන අංක / தொலைபேசி இல. / Telephone Nos. 2889488, 2889489

ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No. 2889491

ඊ මේල් / மின்னஞ்சல் / Email info@rgd.gov.lk, rg@rgd.gov.lk

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

**பதிவாளர் நாயகத் திணைக்களம்**

**REGISTRAR-GENERAL'S DEPARTMENT**

ප්‍රධාන කාර්යාලය

தலைமை அலுவலகம்

**HEAD OFFICE**

වෙබ් අඩවිය / இணையத்தளம் / Web site www.rgdept.lk

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. 565

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.

234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.

234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla.

2016.07.28

දිනය / திகதி / Date: ..............................

සියළුම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්/ ප්‍රාදේශීය ලේකම්වරුන්,

සියළුම අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්,

**<u>සංක්‍රාන්තික ලිංගික ප්‍රජාවගේ උප්පැන්න සහතිකවල</u>**
**<u>නම සහ ස්ත්‍රී/පුරුෂ භාවය සංශෝධනය කිරීම</u>**

සංක්‍රාන්තික ලිංගිකයන් යනු ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ඔවුන්ගේ අභ්‍යන්තර සංවේදිතාවය, තමන් උපතින් ලැබූ ලිංගිකභාවයෙන් වෙනස්ව දැනෙන සියළුම පුද්ගලයන් සඳහා යොදනු ලබන පුළුල් යෙදුමක් ලෙස සැලකේ. මෙවැනි පුද්ගලයන්ට සමාජීය වශයෙන් ඇතිවන විවිධ ගැටළු අවම කරනුවස්, මානව හිමිකම් කොමිෂන් සභාවේ මැදිහත්වීම මත, සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් "ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිගැනීම සඳහා වූ සහතිකය", සෞ - 1257 ආකෘතියෙන් නිකුත් කිරීමට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 01-34/2016 හා 2016/06/16 දිනැති දරණ චක්‍ර ලේඛය මගින් උපදෙස් දී ඇත. එම සෞ - 1257 ආකෘතියේ පිටපතක් ඔබගේ දැන ගැනීම සඳහා මේ සමඟ අමුණා එවමි.

2. එබැවින් සංක්‍රාන්තික ලිංගිකයන් විසින් තම උප්පැන්න ලේඛනයේ ස්ත්‍රී/පුරුෂ භාවය සහ නම සංශෝධනය කිරීමට 52(i) වගන්තිය සහ 27 වගන්තිය යටතේ ප්‍රකාශ පත්‍ර ඉදිරිපත් කිරීමේදී සෞ - 1257 දරණ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිගැනීම සඳහා වූ සහතිකය ලිඛිත සාක්ෂියක් ලෙස ගොනුකර, අදාල සංශෝධනය නිර්දේශ කිරීමටත්, එම සහතිකය මත අදාල සංශෝධන සිදු කිරීමට බලය දෙන ලෙසත් දන්වමි. අදාල ප්‍රකාශ පත්‍රය සමග සෞ - 1257 දරණ සහතිකය උප්පැන්න ලේඛනයේ දෙවන පිටපතට අමුණා තැබීමටද පියවර ගන්නා ලෙස කාරුණිකව දන්වමි.

ඩී. එම්. ගුණසේකර
රෙජිස්ට්‍රාර් ජනරාල්

රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත්:-

1. ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - කරු, දැ.ගැ.ස.
2. ලේකම්, මානව හිමිකම් කොමිෂන් සභාව - කරු, දැ.ගැ.ස.
3. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් - කරු, දැ.ගැ.ස.
4. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - කරු, දැ.ගැ.ස.
5. සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්, මධ්‍යම ලේඛනාගාරය - අවශ්‍ය කටයුතු සඳහා
6. කලාප භාර සියළුම සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - අධීක්ෂණය සඳහා

## HIV යනු කුමක් ද?

HIV යනු මානව ප්‍රතිශක්ති ඌනතා වෛරසයයි. මෙම වෛරසය මිනිස් සිරුර තුල ප්‍රතිශක්තිය අඩුකරන අතර පුද්ගලයෙකුගේ සිරුර තුලට HIV ඇතුළු වූ පසු එම පුද්ගලයා HIV ආසාදිතයෙකු ලෙස සැලකේ. එහිදී ක්‍රම ක්‍රමයෙන් ශරීරය තුල ප්‍රතිශක්තිය හීන කරන අතර එමඟින් පුද්ගලයා රෝගවලට ගොදුරු වීමේ වැඩි අවදානමක් ඇති කරයි.

## AIDS යනු කුමක් ද?

AIDS යනු නතුකරගත් ප්‍රතිශක්ති ඌනතා සහලක්ෂණයයි. HIV ආසාදිත පුද්ගලයාගේ ප්‍රතිශක්තිය ඉතා පහල මට්ටමකට දුර්වල වූ පසු පුද්ගලයා AIDS තත්වයට පත් වේ. ආසාදනය ශරීර ගත වී වසර ගණනාවකට පසු මෙම තත්වය ඇතිවිය හැක.

## HIV වෛරසය ශරීරය තුල ඇත්තේ කොහේ ද?

ආසාදිත පුද්ගලයෙකුගේ රුධිරය, ශුක්‍ර තරලය, යෝනි තරලය, මව්කිරි වැනි පටක තරල තුල HIV වෛරසය දැකිය හැක.

## HIV ආසාදනය බෝවන්නේ කෙසේ ද?

- ආසාදිත පුද්ගලයෙකු සමඟ පවත්වන අනාරක්ෂිත ලිංගික සබඳතාවයක් මඟින් (යෝනි, ගුද, හා මුඛ ලිංගික සබඳතා).
- HIV ආසාදිත රුධිරය හෝ රුධිර කොටස් මඟින්.
- ආසාදිත රුධිරය තැවරුණු සිරින්ජර, ඉදිකටු හෝ තියුණු උපකරණ මගින්
- HIV ආසාදිත මවකගෙන් උපදින දරුවාට ගර්භනී කාලයේදී, දරු ප්‍රසූතියේ දී, මව්කිරි දීම මගින්.

### යමෙකුගේ බාහිර පෙනුමෙන් එම පුද්ගලයා HIV ආසාදිතයකු බව හඳුනා ගත හැකිද?

නැත. HIV ආසාදිත පුද්ගලයකු බාහිර පෙනුමෙන් නිරෝගී විය හැක. ඔහු හෝ ඇය HIV ආසාදිත බව හඳුනාගත හැක්කේ ඒ සඳහාම විශේෂිත රුධිර පරීක්ෂාවක් මගින් පමණි.

### HIV ආසාදනය, අයෙකුට අතට අත දීමෙන් හෝ අනෙකුත් සමාජමය සබඳතා මගින් වෙනත් අයෙකුට රෝගය බෝවිය හැකිද?

නැත. HIV ආසාදනය ලිංගික නොවන සාමාන්‍ය සබඳතා මගින් බෝ නොවේ. අතට අත දීමෙන්, සිප වැළඳ ගැනීමෙන්, පොදු වැසිකිළි භාවිතයෙන් හෝ HIV ආසාදිත අයෙක් පාවිච්චි කළ වීදුරුවෙන් වතුර බීම මගින්, HIV ආසාදනය බෝ නොවේ. එබැවින් HIV ආසාදිත අයෙකු සමඟ සමාජ සබඳතා පැවැත්වීමට කිසිසේත්ම බිය විය යුතු නැත.

### මදුරුවකු දෂ්ඨ කිරීම මගින් HIV ආසාදනය වෙනත් අයෙකුට බෝ විය හැකිද?

HIV ආසාදනය මදුරුවන් දෂ්ඨ කිරීම මගින් බෝ නොවේ. (HIV වෛරසය කෘමි ශරීරය තුළ ප්‍රතිනිෂ්පාදනය නොවන බැවිනි)

### පසු නිරාවරණ ප්‍රති ප්‍රාරක්ෂණය

පසු නිරාවරණ ප්‍රති ප්‍රාරක්ෂණය යනු HIV ආසාදිත රුධිරය හෝ වෙනත් පටක තරලවලට නිරාවරණය වූ පුද්ගලයකු එසේ වී පැය 48ක් ඇතුලත ප්‍රති වෛරස ඖෂධ භාවිත කිරීමයි. එමගින් HIV ආසාදනයට ගොදුරු වීමේ හැකියාව අවම කළ හැක.

### ලිංගික සබඳතා මගින් HIV බෝවීම අවම කර ගන්නේ කෙසේද?

- විවාහය තෙක් ලිංගික සම්බන්ධතා පමා කිරීම මගින්
- එක් විශ්වාසවන්ත සහකරුවෙකුට හෝ සහකාරියකට පමණක් ලිංගික සබඳතා සීමා කිරීම මගින්
- විශ්වාසවන්ත සහකරු හෝ සහකාරිය හැරුනු කොට අනෙකුත් ඕනෑම අයෙකු සමඟ ලිංගික සබඳතා පැවැත්වීමේදී සෑම විටම නිවැරදි ලෙස කොන්ඩමයක් භාවිත කිරීම මගින්.

## HIV ආසාදනය වැළැක්වීම සඳහා කොන්ඩම් කොතෙක් දුරට සාර්ථකද?

නිවැරදි කොන්ඩම භාවිතය මගින් HIV ඇතුළු සියළුම ලිංගාශ්‍රිත රෝග ඉතා සාර්ථකව වළක්වා ගත හැක. එමගින් උපරිම ආරක්ෂාව ලබා ගැනීමට නම් එය නිවැරදිව සෑම විටම භාවිත කිරීම අවශ්‍ය වේ. වැරදි ලෙස කොන්ඩම භාවිත කිරීම මගින් කොන්ඩමය කැඩී යාමට හෝ ගැලවී යාමට ඉඩ ඇති බැවින් එවිට කොන්ඩමයෙන් ලැබෙන ආරක්ෂාව අඩු විය හැක.

## මවගෙන් දරුවාට HIV බෝ වීම වළක්වා ගන්නේ කෙසේද?

HIV ආසාදිත මවගෙන් දරුවාට HIV බෝ වීම වැළැක්වීමට ඉතා සාර්ථක ප්‍රති වෛරස ඖෂධ ඇත. එම ඖෂධ ගර්භනී කාලය තුළදී භාවිත කිරීමෙන් සහ අනෙකුත් වෛද්‍ය උපදෙස් පිළිපැදීමෙන් නූපන් දරුවා HIV ආසාදනයෙන් ගලවා ගත හැක.

## HIV පරීක්ෂාවක් යනු කුමක්ද?

HIV පරීක්ෂාවක් යනු යම් අයෙකුගේ ශරීරය තුළට HIV ආසාදනය ඇතුළු වී ඇත්දැයි පරීක්ෂා කරන පරීක්ෂණයකි. මෙහිදී බහුල වශයෙන් භාවිත කරන්නේ HIV වෛරසයට විරුද්ධ ප්‍රතිදේහ හඳුනා ගැනීම මගින් ආසාදනය හඳුනා ගන්නා ක්‍රමය වේ. මේ සඳහා ආසාදනය ශරීරගත වී සති 06 සිට මාස 03 කාලයක් ගත වේ. ආසාදනය ශරීරගත වුවද රුධිර පරීක්ෂාවක් මගින් හඳුනාගත නොහැකි මුල් කාලය කවුළු සමය ලෙස හැඳින්වේ. මෙම කාලය තුල එක් අයෙකුගෙන් තවත් අයෙකුට රෝගය බෝ විය හැක.

## ඔබ HIV පරීක්ෂාවක් කරගත යුත්තේ ඇයි?

ඔබගේ HIV ආසාදන තත්වය දැන ගැනීමේ වැදගත් වාසි තුනකි. ඔබ HIV ආසාදිත නම්

- ඔබට රෝග ලක්ෂණ මතු වීමට කලින් අවශ්‍ය ප්‍රතිකාර හා සේවාවන් සඳහා යොමු විය හැක. එමගින් ඔබගේ ජීවන තත්වය නගා සිටුවිය හැකි අතර ආයු කාලය වසර ගණනාවකින් දීර්ඝ කරගත හැක.
- ඔබට HIV ආසාදනය අනෙකුත් අයට බෝ වීම වැළැක්වීමට අවශ්‍ය සියළු ක්‍රියාමාර්ග ගැනීමට ඉඩ සැලසේ.
- ඔබ ගර්භනී කාන්තාවක් නම් ඔබගේ නූපන් දරුවා HIV ආසාදනයෙන් ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය වෛද්‍ය උපදෙස් ලබා ගැනීමට ඉඩ සැලසේ.

### මම HIV පරීක්ෂාව සිදුකර ගත යුත්තේ කොහේදීද?

සියළුම මහරෝහල් හා දිසා රෝහල් වලට අනුබද්ධ ලිංගාශ්‍රිත රෝග සායන මගින් නොමිලේ කරගත හැක. මේ සඳහා යොමු කිරීමේ ලිපි අවශ්‍ය නොවේ.

### මෙම පරීක්ෂණයේ ප්‍රතිඵල රහසිගතව පවත්වාගෙන යන්නේද?

ඔව්. HIV රුධිර පරීක්ෂණයේ ප්‍රතිඵල සැම විටම රහස්‍යභාවය රැකෙන පරිදි තබනු ඇත. එම ප්‍රතිඵලය අදාල පුද්ගලයා හැරුණු කොට වෙනත් කිසිම පුද්ගලයකුට නොදෙනු ඇත.

### HIV ස්වයං-පරීක්ෂාව

HIV ස්වයං-පරීක්ෂාව මගින් යම් අයකුට HIV පරීක්ෂණයක් සිදු කර තමන්ගේ ප්‍රතිඵලය තම නිවසේ හෝ වෙනත් පුද්ගලික ස්ථානයකදී දැන ගැනීමට ඉඩ සලසයි. මෙම පරීක්ෂණය විනාඩි 20 ක් ඇතුළත ප්‍රතිඵල ලබා දෙයි. HIV ස්වයං පරීක්ෂණ පහසුකම ලිංගාශ්‍රිත රෝග සායනවල ඇති අතර එයට අමතරව දුරකථන අංක 071 637 9192 ඇමතීමෙන් තැපැල් මාර්ගයෙන්ද ඇණවුම් කළ හැකිය.

### Know4sure.lk වෙබ් අඩවිය

Know4sure.lk වෙබ් අඩවිය මගීන් යම් අයකුගේ HIV සඳහා ඇති අවධානම තක්සේරු කිරීමට සහ ආරක්ෂිත, රහසිගත HIV පරීක්ෂණයක් වෙන්කරවා ගැනීමට මෙන්ම ලිංගාශ්‍රිත රෝග සායනයට පැමිණීමට වේලාව වෙන්කරවා ගැනීම වැනි සේවාවන් නොමිලේ ලබා ගත හැක.